


**ශ්‍රී. බු. ව. 2561 ක්වූ  වෙසක් මස කලාපය, රා. ව. 2017 ක් වූ මැයි මස 10 වන දින**

**දෙව්නුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති**

**ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

# බුදුරජාණන් වහන්සේ හඳුනාගෙන වාද විවාද වලින් සමුගනිමු.

**"නාහං භිකඛවෙ, ලොකෙන විවදමි. ලොකොච ඛො භිකඛවෙ, මයා විවදති.**

**න භිකඛවෙ, ධමමවාදී කෙනචි ලොකසමිං විවදති."**

**(සංයුතත නිකාය ඛනධ සංයුතතයෙහි පුපඵ සූත්‍රය)**

**"මහණෙනි මම ලෝකයා සමග වාද නොකරමි. මහණෙනි, ලෝකයා වූ කලී මා සමග වාද කෙරෙයි. මහණෙනි, ධර්මවාදියෙක් ලොව කිසිවෙක් සමග වාද විවාද නොකෙරෙයි".**

**ගරු සවාමීන්වහන්ස, කාරුණික පින්වත්නි,**

**අද වෙසක් පුර පසළොස්වක පොහොය දිනයයි. සම්බුදධ පරිනිර්වාණයෙන් අදට වසර 2561 ගතවෙයි. මේ උතුම් දිනයෙහි වටිනා කම සියලුම දෙනා දනිත්. ලුම්බිණි සල්උයනේදී සිදුහත් කුමරුගේ උත්පත්තිය සිදුවීම, ඇසතු බෝරුක මුලදී සම්මා සම්බුදධත්වයට පත්වීම, වසර 45 තිස්සේ ලෝවැසියන්ට ධර්මයෙන් සංග්‍රහකොට කුසිනාරා නුවර මල්ල රජ දරුවන්ගේ උපවර්තන නම් සල් උයනේදී පිරිනිවන් පෑම යන කරුණු සිදුවූයේ අද වැනි වෙසක් පුර පසළොස්වක පොහොය දිනයකය.**

මෙම උතුම් වෙසක් පෝය දිනයෙහි ගිහි පැවිදි අපි හැමෝම බුදුරජානන් වහන්සේට ගෞරව සැලකිළි කිරීමට පුරුදු වී සිටිමු. ඒවා ආමිස හා ප්‍රතිපත්ති පූජා වශයෙන් කොටස් දෙකකට බෙදේ. ආමිස පූජාවලට වඩා වටින්නේ ප්‍රතිපත්ති පූජාවෝය.

ප්‍රතිපත්ති පූජාව යනුවෙන් අදහස් කරන්නේ තථාගතයන් වහන්සේ දේශණා කළ ධර්මය නිවැරදිව හඳුනාගෙන ඒ ධර්මය අපේ ජීවිතවලට සම්බන්ධකර ගැනීමයි. බුදුරජාණන් වහන්සේ ගිහි පැවිදි අප හැම දෙනාටම දේශණා කළේ "සදතෙථ ඝටථ, වායමථ" යනුවෙන් සත් අර්ථය නම් වූ නිවන ලබාගැනීමට උත්සාහ කරන්න කියාය.

ගිහිගෙදර කරදරවලින් මිදී මේ උතුම් පෝය දිනයෙහි උපෝසථ අෂ්ටාංග සීලය සමාදන්වී කටයුතු කරන කුඩා දරුවන් තරුණ තරුණියන්, වැඩිහිටියන් යන සියළුම දෙනාත් ඒ පිරිසට ධර්ම මාර්ගය කියාදෙන ස්වාමීන් වහන්සේලාත් මේ සිදුකරන්නේ සත් අර්ථය නම් වූ නිවන අවබෝධකර ගැනීමේ වැඩ පිළිවෙළට සූදානම් වීමකි. වැලිගම ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදය ඉදිරිපත් කරන මෙම සද්ධර්ම පුෂ්පයෙන් අප බලාපොරොත්තුවන්නේ අප ගෞතම බුදුරජාණන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ චරිතය තුළ පැවති එක් ගුණාංගයක් හඳුන්වා දීමටයි.

මෙහිදී අප මූලාශ්‍රය වශයෙන් තබා ගත්තේ සංයුත්ත නිකායේ ඛන්ධ සංයුක්තයේ සඳහන්වන පුපඵ සූත්‍රයයි. එහි අපට අවශ්‍ය කරන සූත්‍ර පාඨය මෙහි මුලින් සඳහන් කොට ඇත. එහි සඳහන් කර ඇත්තේ අප බුදුරජානන්වහන්සේ ලෝකය සමග වාද නොකරන බවත් ලෝකයා බුදුන්වහන්සේ සමග වාද කරන බවත්ය. මෙහි අදහස තේරුම් ගැනීමට නම් සූත්‍රයෙහි සඳහන් කාරණා ගැන කෙටියෙන් අවබෝධ කරගත යුතුයි.

තථාගතයන් වහන්සේ ලෝකයා සමග වාද නොකිරීමට හේතුව මේ සූත්‍රය මෙසේ සඳහන් කරයි.

"මහණෙනි, ලොව පණ්ඩිතයන් විසින් යමක් නැතැයි සම්මත නම් මමද එය නැතැයි කියමි. මහණෙනි ලොව යමෙක් පණ්ඩිතයන් විසින් ඇතැයි සම්මත නම් මහණෙනි මමද එය ඇතැයි කියමි. මෙයින් අදහස් කරන්නේ අනෙකා ඉදිරිපත් කරන නිවැරදි මතයට තමා එකගවන බවයි. එවිට වාද කිරීමට අවශ්‍ය නැත.

තවදුරටත් මේ ගැන විස්තර කරන පුපඵ සූත්‍රය මෙසේ සඳහන් කරයි.

"මහණෙනි නිත්‍යවූ, වෙනස් නොවන්නාවූ රූපයක් ලොව නැතැයි ලොව ජීවත්වන පණ්ඩිතයින් විසින් සම්මතය. මමද එය නැතැයි කියමි. වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන කිසිවක් තුළ ස්ථිර කිසිවක් නැතැයි ලෝකයා ප්‍රකාශ කරති. මමද එය නැතැයි ප්‍රකාශ කරමි."

මහණෙනි මේ ලෝකයේ ජීවත්වන පණ්ඩිතයින් විසින් නිත්‍ය වූ වෙනස් නොවන්නාවූ රූපයක් ලොව ඇතියි ප්‍රකාශකරයි නම් මමද එසේ ප්‍රකාශ කරමි. වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන සියල්ල තුළ එබඳු දෙයක් ඇතැයි ප්‍රකාශ කෙරේ නම් මමද එය ඇතැයි ප්‍රකාශ කරමි.

බැලූ බැල්මට කෙනෙකුට මේ ප්‍රකාශ දෙක ගැටළු සහගත වෙන්නට පුළුවන. නමුත් කල්පනාකාරීව මේදෙස බැලුවොත් මේ ගැටළුව විසඳගත හැකිය. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යනු පුද්ගලයා සකස් වී තිබෙන ශක්තීන් 5කි. මේ පහ තුළම නිත්‍ය වූ කිසිවක් නැති බව පෙනෙන්නේ කරුණු අවබෝධ කරගත් පණ්ඩිතයාට පමණි. එබඳු පණ්ඩිතයින් මේ පිළිබඳව වාද නොකර ගන්නා බව පැවසීම මෙහි අරමුණයි.

බුදුරජාණන්වහන්සේගේ ගුණ නවයක් පිළිබඳව අපි නිතර සිහිපත් කරමු. එහි "ලෝක විදූ" නම් ගුණයක් එයි. එහි සඳහන් වන්නේ ලෝකය ගැන දැනගත් බවයි. කුමක්ද දැන ගත්තේ ආධ්‍යාත්මික වූත් බාහිරවූත් මේ ලෝකය කැඩෙන බිඳෙන වෙනස්වන සවභාවයෙන් යුක්ත බවයි. "ලුජ්ජති පලුජ්ජතීති ලොකො" යනුවෙන් දැක්වූයේ එම අදහසය.

තථාගතයන්වහන්සේ මේ ලෝක තත්ත්වය මෙසේ මැනවින් අවබෝධකරගෙන ලෝකයාට දේශණාකළත් කෙලෙස් සහිත අන්ධබාලයින්ට මෙය අවබෝධ නොවෙයි. ඒ සඳහා මම කුමක් කරම්ද කියා බුදුන්වහන්සේ දේශණා කරති. එවැනි අය සමග මගේ වාදයක් නැත. නමුත් ඒ අය මා සමග වාද කරති.

මෙම සූත්‍රයට අටුවා සැපයූ බුද්ධඝෝෂ මාහිමියන් සාරත්ථපපකාසිනී නම් වූ සංයුක්ත නිකාය අටුවාවේදී ලෝක ශබ්දය ගැන මෙසේ විස්තර කර ඇත. මම ලෝකයා සමග වාද විවාද නොකරමි යන තැන සඳහන් වන්නේ සත්ත්ව ලෝකය ගැනයි. මේ ලෝකයේ ලෝක ධර්මයෝ ඇත යනුවෙන් ප්‍රකාශවන තැන ලෝකය යනු සංස්කාර ලෝකයයි. තථාගතයන් වහන්සේ ලොව ඉපිද ලොව හැදී වැඩී ලෝකයෙහි නොඇලී  වැඩ සිටිති යන තැන මේ භෞතික ලෝකය ගැන සඳහන් කර ඇත. ලෝක ශබ්දය කොතැන කෙසේ අර්ථ දක්වමින් සඳහන් උවත් එහි සවභාවය කැඩෙන බිඳෙන වෙනස්වන සවභාවයයි. මෙය මැනවින් අවබෝධ වූ පුද්ගලයාට ලොව තුළ කිසිදු වාදයක් ඇති නොවේ. එසේ වාද නොකරන පුද්ගලයා ලෝකය තුළ ඉපදී එහිම හැදී වැඩී ලෝකය සමග නොගැටී ජීවත්වේ. යම් සේ මඩෙහි හටගත් නෙළුම මඩෙහි හැදී වැඩී මඩෙන් ඉවත්ව ලෝකයම සුවඳවත් කරන්නාක් මෙනි. මේ වෙසක් පුර පසළොස්වක පොහොය දිනයෙහි අප සියළුම දෙනා බුදුන්වහන්සේ නැමති පද්මය හඳුනාගෙන වාද විවාදවලින් තොරව ජීවත් උවහොත් අපටත් සත් අර්ථය වූ නිවන ලබා ගත හැක. බුදුන්වහන්සේට ප්‍රතිපත්තියෙන් පූජා කරනවාය කියන්නේ එබඳු වැඩ පිළිවෙලකටයි.

ඉහත කී ලෝක තත්ත්වය මැනවින් තේරුම් ගත් බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතන නම් වූ මිගදායේදී දම්සක් පැවතුම් සූත්‍රය දේශණා කරමින් මුලින්ම ලෝකයට දුන් පණිවිඩය වූයේ හේතු ප්‍රත්‍ය තුළින් හටගත් මේ සංස්කාර ලෝකය අනිත්‍ය බවය. එදා එම විශ්ව සාධාරණ අනිත්‍යතාවය නැමති පණිවුඩය අවබෝධවූයේ නුවණැතිව ක්‍රියාකළ කොණ්ඩඤ්ඤ හිමියන්ට පමණි. එහිදී බුදුන්වහන්සේ එම

භික්ෂුව හැඳින්වූයේ නුවණැති කොණ්ඩඤ්ඤ වශයෙනි. යමෙකුට ලෝකය පිළිබඳව ත්‍රිලක්ෂණයට අනුව වැටහේ නම් ඔවුන්ට වාද නැත.

දෙවන සූත්‍රය වන පඤ්චවග්ගිය සූත්‍රය හෙවත් අනත්ත ලක්ඛණ සූත්‍රය දේශණා කරමින් ඉතිරි භික්ෂූන් හතර දෙනාට ප්‍රශ්නෝත්තර ක්‍රමයකට අනුව දේශණාකළේ රූප, වේදනා, සඤ්ඤ, සංඛාර, විඤ්ඤාණ යන සියල්ල අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණයට හසුවන බවයි. උන් වහන්සේලාද නිවන් අවබෝධකරගත්තේ එම ලෝක තත්ත්වය මැනවින් අවබෝධකරගත් නිසාය.

බුදුරජාණන්වහන්සේ ඉහත ලෝක තත්ත්වය තේරුම් කරදීම සඳහා ඉතා සරල උපමාවන් භාවිතාකර ඇත. රූපය පෙණ පිඩකි. වේදනාව දියබුබුලකි. සඤ්ඤව මිරිගුවකි. සංස්කාර කෙසෙල් ගසකි. විඤ්ඤාණය මායාවකි. මේ උපමා පහෙන්ම උගන්වන්නේ ඒවා අස්ථිර බවයි. නමුත් එම චංචල ලෝකය තුළ නිශ්චල නිගමනවලට බැස ක්‍රියා කරන අය වාද විවාද කර ගනිති. එබඳු කෙනෙක් ලෙස සාති භික්ෂුව හැඳින්විය හැක. එම භික්ෂුව කියා සිටියේ එකම විඤ්ඤාණය වෙනස් නොවී භවයෙන් භවයට සැරිසරණා බවයි. "තදෙවිධං විඤ්ඤාණං සන්ධාවති සංසරති අනඤ්ඤං" යනුවෙන් මජ්ඣිම නිකායේ මහා තණ්හාසංඛය සූත්‍රයේදී දේශණා කළේ එයයි. එහිදී බුදුන්වහන්සේ සාති භික්ෂුව හඳුන්වා ඇත්තේ හිස් පුරුෂයෙකු ලෙසයි. ත්‍රිලක්ෂණමය පදනම තුළ ක්‍රියාත්මක වන බුදුදහමෙහි නිත්‍ය වූ විඤ්ඤාණයක් පිළිගන්නා වූ ඔබට බුදුදහමේ උණුසුමවත් වැදී නැති බව දේශණා කළ සේක. අප විස්තර කරන පුප්ඵ සූත්‍රයේදී බුදුන්වහන්සේ අසන්නේ කෙලෙස් සහිත අන්ධබාල පුද්ගලයින්ට මෙම ලෝක තත්ත්වය හරියට නොවැටහේනම් මම කුමක් කරම්ද ? කියාය.

අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, අසුභ යනු ලොව පවත්නා සදතනික සත්‍යයෝය. ඒවා පිළිබඳව නිත්‍ය, සුඛ, ආත්ම, සුභ වශයෙන් සැලකීම බුදුදහම හඳුන්වන්නේ විපර්යාස හැටියටයි. විපර්යාසය යනු වැරදි වැටහීම්ය. කරුණු අවබෝධකර ගැනීමට නොහැකි බාලයින් මෙසේ සිතා වාද විවාද ඇතිකර ගෙන සසර දික් කරගනී. බුදුන්වහන්සේ හඳුනාගත් නුවණැති අය ත්‍රිලක්ෂණය හඳුනාගෙන වාද විවාදවලින් තොරව සසර කෙටිකර ගනී. බුදුන්වහන්සේට ප්‍රතිපත්තිවශයෙන් පූජා කරනවාය කියන්නේ එවැනි වැල පිළිවෙළකටය.

නූතනයේ ජීවත්වන ගිහිපැවිදි අපි හැමදෙනාම නිබඳවම වාද විවාදවලට පැටලී සිටිමු. මේ සියළු වාද වලට හේතුව ත්‍රිලක්ෂණය අමතක කිරීමයි. අඹු සැමියන් අතර ඇතිවන බොහෝ වාදවලට හේතුව රූපය නිත්‍යයයි සිතා කටයුතු කිරීමයි. විවාහ වන දිනයේ සවාමි භාර්යාවගේ රූපය ඉතාම ප්‍රසන්නය. නමුත් දූ දරුවන් ලැබී ටික කලක් යන විට එම රූපය ජරාවට පත්වෙයි. එහිදී බොහෝ සවාමිපුත්‍රවරු ස්වාමිදියණියට දෙස් පවරමින් ගේ තුළ වාද විවාද කරගනී. නමුත් රූපය අනිත්‍යය යන හැඟීමෙන් ක්‍රියා කරන සවාමිපුත්‍රවරු ලෝක ස්වභාවය මෙය යයි සලකා වාද විවාද නැතිව ජීවත්වෙති. එම සවාමිපුත්‍රවරු බුදුන්වහන්සේ හඳුනාගත් පිරිසකි. භාර්යාවරුත් සවාමි පුත්‍රයාගේ ජරාවට පත්වන සිරුර දෙස බලා ලෝක සවභාවය තේරුම්ගෙන වාද විවාද වලින් තොරව කටයුතු කරයි නම් එය බුදුන්වහන්සේට ප්‍රතිපත්තියෙන් පූජා කිරීමක් ලෙස සැලකිය හැක.

පසුගිය දිනෙක අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් වුනි. එහිදී තම දරුවන්ගේ හැකියාවන් පිළිබඳව නිත්‍ය වූ හැඟීම් ඇතිකරගෙන සිටි සමහර දෙමාපියන් තම දරුවන් සමග වාද විවාද ඇතිකරගත්හ. අප නම් සිතා සිටියේ "ඒ" නමයක්ම ගනී කියාය. මෙසේ වාද කිරීමේ ප්‍රතිඵලය වූයේ මේ වනවිට දරුවන් තුන්දෙනෙක් සියදිවි නසා ගැනීමයි.

පුද්ගල පියුම සමාජය නැමති විලේ විකසිත නොවී අකාලයේ මිලිනවූයේ දරුවන්ගේ හැකියාවන් පිළිබඳ නිත්‍ය වු සක්ද්කදවන් ගොඩ නගාගෙන තිබූ නිසායි. එවැනි දරුවන්ගේ හැකියාවන් පිළිබඳව මධ්‍යස්ථව සිතා ක්‍රියා කළා නම් එම දෙමාපියන් වාද විවාදවලින් මිදී මෙසේ ප්‍රකාශ කරනු ඇත. දරුවනේ ඔය ප්‍රතිඵල වලට කලබල වෙන්න එපා. ඔය ලෝක සවභාවයේ හැටි අපි ඊළඟ විභාගයට හොඳට මහන්සි වී වැඩ කරමු. එවැනි දෙමාපියන් වෙත්නම් ඔවුන් බුදුන්වහන්සේගේ චින්තනය හඳුනාගත් පිරිසකි. ඒ නිසා මේ වෙසක් පෝය දිනයේදී අප සිතා ගත යුත්තේ චංචල ලෝකය තුළ නිශ්චල තීරණ නොගෙන මධ්‍යසථව ක්‍රියා කළ යුතුයි. එසේ ක්‍රියා කරන සියලුම ගිහි පැවිදි පිරිස් බුදුන්වහන්සේට ප්‍රතිපත්තියෙන් පූජා කොට වාද වලින් තොරව සහනයෙන් ජීවත්වීමට අධිෂ්ඨාන කරගත යුතුයි.

